# ව්‍යවසායකත්ව අධ්‍යයනය

## ②

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 10 ශ්‍රේණිය

## ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය

**(1) කෙටි පිළිතුරු සපයන්න.**

1. ව්‍යාපාරය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
2. ව්‍යාපාරිකයන් යනු කවුරුන්ද?
3. මිනිස් ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍යතා හා වුවමනා සපුරා ගත යුතුය. මෙහි සඳහන් අවශ්‍යතා හා වුවමනා යන්නෙන් අදහස් වන්නේ මොනවාද?
4. අවශ්‍යතා 02ක් හා ඒ හා සම්බන්ධ වුවමනා 02ක් ලියන්න.
5. එදිනෙදා ජීවිතයේ විවිධ කටයුතු සඳහා අප භාණ්ඩ හා සේවා උපයෝගී කර ගනී. එවැනි අවස්ථාවන් 03ක් හා ඒ සඳහා යොදා ගන්නා භාණ්ඩ හා සේවා 02 බැගින් ලියන්න.
6. අවශ්‍යතා හා වුවමනා සපුරා ගන්නේ භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමෙනි.
   - i. අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 03ක් ලියන්න.
   - ii. භාණ්ඩ හා සේවා යනු මොනවාද?
   - iii. භාණ්ඩ හා සේවාවල ඇති ලක්ෂණ 03 බැගින් ලියන්න.
   - iv. පහත සඳහන් අවශ්‍යතා ඉටු කර ගත හැකි ආකාර 02 බැගින් ලියන්න.
     (A) සෞඛ්‍යය (B) සන්නිවේදනය
7. ව්‍යාපාර පිළිබඳ ඔබගේ අවබෝධය වැඩි කර ගැනීමට ව්‍යාපාරවල ගති ලක්ෂණ ඔබ හඳුනාගත යුතුය. එසේ ඔබ හඳුනාගත් ව්‍යාපාර ගති ලක්ෂණ 04ක් ලියන්න.
8. ව්‍යාපාරිකයන් ව්‍යවසායකයන් ලෙස ද ව්‍යවසායකයන් ව්‍යාපාරිකයන් ලෙස ද හැඳින්විය හැකි අවස්ථා ඇත. ඒ අනුව මෙම දෙපාර්ශ්වය අතර හඳුනා ගත හැකි සමානකම් 04ක් ලියන්න.
9.




ඉහත ඉදිරිපත් කර ඇති වෙන් රූපයෙන් දැක්වෙන ව්‍යවසායක ව්‍යාපාරික සම්බන්ධය ඔබේ වචනයෙන් ලියන්න.

10. "සෑම ව්‍යාපාරිකයෙකුම ව්‍යවසායකයෙකු වන්නේ නැත. එසේම සෑම ව්‍යවසායකයෙකුම ව්‍යාපාරිකයෙකු ද නොවේ." මෙම ප්‍රකාශය සමඟ එකඟවන්නේද? හේතු ඉදිරිපත් කරන්න.
11. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර වෙනස්කම් 04ක් ලියන්න.
12. "ව්‍යාපාරිකයන්ට වඩා සාර්ථක වීමේ හැකියාව ඇත්තේ ව්‍යවසායකයන්ටය." මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස පැහැදිලි කරන්න.
13. ඔබ නිවසේ හෝ ඔබ ප්‍රදේශයේ පවතින සම්පත් භාවිතයෙන් යම් නිෂ්පාදනයක් කිරීමට අදහස් කරන ඔබ, එම කාර්යය සාර්ථක කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාවන් හා ඔබගේ සැලසුම් කෙටියෙන් ලියන්න. මෙහිදී ඔබ ඉගෙන ගත් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ, ව්‍යාපාර ගති ලක්ෂණ හා ඔබගේ ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා ඔබගේ ව්‍යවසායකත්ව අධ්‍යයන දැනුම උපයෝගී කර ගන්න.
14. "ව්‍යවසායකයන් යනු ලාභ අපේක්ෂාවෙන් කටයුතු කරනු ලබන ව්‍යාපාරිකයන් පමණක් නොවේ." ඔබ දන්නා ව්‍යවසායකයින් වර්ග නම් කරන්න.
15. ගෙයින් ගෙට ගොස් මසා නිම කළ මහත්වරුන්ගේ ඇඳුම් විකුණූ සාරංග දෙනිපිටිය මහතා, නොබෝ කලකින් Handsom නමින් රෙදිපිළි ව්‍යාපාරයක් ආරම්භ කළේය. මෙම ආයතනයේ කළමනාකරු වන මොහු ආයතනයේ සියලු කටයුතු සොයා බලා අවශ්‍ය මඟ පෙන්වීම ද සිදු කරමින් සේවකයන් සමඟ ඉතා සුහදශීලීව කටයුතු කරයි. අද වන විට ප්‍රදේශය පුරා ඉහළ ජනප්‍රියත්වයක් ලබා ඇති Handsom රෙදිපිළි ආයතනයේ දියුණුවේ රහස සාරංග දෙනිපිටිය මහතාගේ ක්‍රියාකලාපය බව සියලු දෙනාගේ අදහසයි.
    i. ඉහත විස්තරය අනුව සාරංග දෙනිපිටිය මහතා කුමන වර්ගයේ ව්‍යවසායකයෙක්දැයි ඔබ නිගමනය කරන්නේද?
    ii. ඔබ දන්නා අනෙකුත් ව්‍යවසායකයන් වර්ග නම් කරන්න.
    iii. ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර ඇති සමානකම් 03ක් නම් කරන්න.
    iv. ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස්කම් 03ක් ලියන්න.
    v. ඔබ සාරංග නම්, ඔබේ ව්‍යාපාරයේ අලෙවිය වර්ධනය සඳහා ගත හැකි ක්‍රියා මාර්ග 03ක් යෝජනා කරන්න.
16. ව්‍යාපාරවල ගති ලක්ෂණයක් ලෙස ආර්ථික කටයුත්තක් වීම ගත හැකිය. ආර්ථික කටයුත්තක් යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

**(2) පහත ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද ඉදිරියෙන් දී ඇති හිස්තැනෙහි සටහන් කරන්න.**

1. මිනිස් අවශ්‍යතා සපුරා ගන්නේ භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමෙනි. (........)
2. අවශ්‍යතා හා වුවමනා අසීමිත වේ. (........)
3. ව්‍යවසායකයා ලාභ පමණක් උපරිම කර ගැනීමට කටයුතු කරයි. (........)

4. ආයතනයක සේවකයන්ට ද ව්‍යවසායකයන් විය හැකිය. (........)
5. ගනුදෙනු අඛණ්ඩව සිදු වීම ව්‍යාපාරවල ලක්ෂණයකි. (........)
6. ව්‍යාපාරිකයා අවදානමක් බාර නොගන්නා අතර ව්‍යවසායකයා අවදානම කැමැත්තෙන් බාර ගනී. (........)
7. ලාභ අපේක්ෂා නොකරන ව්‍යවසායකයෝ ද ඇත. (........)
8. අවශ්‍යතා සපුරාගැනීමට භාණ්ඩ යොදා ගැනීම අත්‍යාවශ්‍ය වන අතර සේවා පරිභෝජනය එතරම් අවශ්‍ය නොවේ. (........)
9. වුවමනා ඇති වන්නේ අවශ්‍යතාවට පෙරය. (........)
10. සමහර ව්‍යවසායකයෝ ව්‍යාපාරිකයෝ වෙති. (........)
11. මූල්‍යමය ගනුදෙනු සැලකිල්ලට ගැනීම ව්‍යාපාරවල ලක්ෂණයක් නොවේ. (........)
12. ව්‍යවසායකයා ගැටළු නිර්මාණශීලීව විසඳයි. (........)
13. අභ්‍යන්තරික ව්‍යවසායකයෝ සමාජීය ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයයි. (........)
14. සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මැතිතුමා ව්‍යාපාර ව්‍යවසායකයෙකු ලෙස නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ලංකාවට හඳුන්වා දුන්නේය. (........)
15. මිනිසාගේ අවශ්‍යතා වුවමනා සපුරාලන ඕනෑම දෙයක් භාණ්ඩ හා සේවා ලෙස හැඳින්විය හැකිය. (........)

**(3) හිස්තැන් පුරවන්න.**

1. මිනිසාගේ අවශ්‍යතා සපුරා ගැනීමේ විවිධ ස්වරූප .................... නම් වේ.
2. වුවමනා පිරිමසා ගැනීම තුළින් ...................... ඉටු වේ.
3. ව්‍යාපාර කටයුතුවල නිරතවන්නා ..................... ලෙස හඳුන්වයි.
4. ............................ හා ........................ මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලයි.
5. භාණ්ඩවල භෞතික පැවැත්මක් ඇත. ඒවා ...................... වේ.
6. සපයන්නාගෙන් වෙන් කළ නොහැක්කේ .......................
7. ආහාර ......................... වන අතර පිට්ටු ................... ගණයට වැටේ.
8. සෑම ව්‍යාපාරිකයෙක්ම ................... නොවේ.
9. ව්‍යවසායකයන් වන ............................ ද ඇත.
10. සමාජීය ගැටළුවකට විසඳුම් ඉදිරිපත් කරමින් නව නිපැයුම් සිදු කරන්නා ................... ව්‍යවසායකයෙකි.